**බුද්ධිමය දේපළ අරමුදල - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධිමය දේපළ අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වල ගැසට් නිවේදන පලකිරීමට අදාලව ගෙවියයුතු පිළිවලින් රු.360,241 ක් හා රු.1,087,949 ක් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වියදම පූර්ව වර්ෂ ලාභයට ගැලපීම් කර ගිණුම්කරණ දෝෂය නිවැරදි කරන ලෙසට ගණකාධිකාරි වෙත උපදෙස් ලබා දී ඇත. | වර්ෂයට අදාලව දරණු ලබන සියළුම වියදම් අදාල වර්ෂය තුලදී ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුයි. |
| ආ) | 2019 වර්ෂයේ පරිගණක උපාංග නඩත්තු කිරීම් ගිවිසුම් වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දින ගෙවන ලද අත්තිකාරම් මුදල රු.110,262 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී පූර්ව වර්ෂ ලාභය ගැලපීම් කර මෙම වරද නිවැරදි කර ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීම සඳහා ගණකාධිකාරි වෙත උපදෙස් ලබාදෙන ලදී. | ඉදිරියට කරන ලද ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරිම නොකල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 175 වන වගන්තියට යටත්ව, 2006 අංක 01 දරන බුද්ධිමය දේපළ නියෝග 58 (10) (ii) වගන්තිය | අනුයෝජිතයින් ලියාපදිංචි කිරීමට අදාලව 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 175 (5) වගන්තිය ප්‍රකාරව වලංගු කාලය ඉකුත් වී මාස 06 ක් ඇතුළත නියම කරනු ලබන අධිභාරයක් ගෙවීම මත ලියාපදිංචිය අළුත් කළ හැකි වුවත් නියෝග 58 හි 10(ii) ප්‍රකාරව ලියාපදිංචි කාලය ඉකුත් වී සති 02 ක් තුල අළුත් කිරීමේ ගාස්තු ගෙවා නැත්නම් ලේඛනයෙන් ඉවත් කළ යුතු බැවින් පරස්පරතාවයක් ඇති වී තිබුණි. | පනතේ සඳහන් විධි විධාන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගනිමින් සිටී. | පනතේ වගන්තිවල ට අනුකූලව කටයුතු කිරීම කල යුතුව ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.91,523,739 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.75,794,322 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,729,417 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙළඳ ලකුණු ආදායම රු.6,369,878 කින් වර්ධනය වීම හා ආයෝජන ලාභ රු.10,355,053 ක් ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකෙරමින් පැවතියදී ඒ ආශ්‍රිත ඉඩම් සංචාරක කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීම නිසා ඒ සඳහා වැය වූ රු.22,298,751 ක මුදල නාගරික | බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය සඳහා වැය වූ වියදම් ප්‍රතිපූර්ණය කිරීම ස.තො.ස ආයතනය විසින් ප්‍රතික්ෂේප කරන | වියදම් ප්‍රතිපූර්ණය කිරීම හෝ නීති උපදෙස් මත ක්‍රියාකල යුතුවීම. |

| | |
|---|---|
| සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීම සඳහා 2015 මාර්තු 13 දිනැති අංක අමප/15/0272/625/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2015 අප්‍රේල් 23 දින අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී මුදල අයකරගත නොහැකි වී තිබුණි. | ලද බැවින් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ ඉදිරි උපදෙස් පරිදි කටයුතු කරනු ලැබේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම** | | |
| (i) | සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද වෙළඳ ලකුණු සංඛ්‍යාව 5,192 ක් වූ අතර ඒ තුල 1992 සිට 2007 දක්වා ලද අයදුම්පත් 625 ක් විය. වෙළඳ ලකුණක් වසර 10 ක කාලයක් දක්වා වලංගු වන අතර සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කළ වෙළඳ ලකුණු තුළ අඩංගු වූ 2008 ට පෙර ලැබී ඇති අයදුම්පත් ඒවා ලියාපදිංචි කරන අවස්ථාව වන විට වසර 10 ක වලංගු කාලයද අවසන් වී තිබුණි. | වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීම පියවර ගණනාවකින් සමන්විත වන සංකීර්ණ ක්‍රියාවලියකි. ප්‍රමාණවත් කාර්යමණ්ඩලක් නොමැති වීම හා අයදුම්පත් ගොනු කල දිනය සහ ලියාපදිංචි සහතික නිකුත්කල දිනය අතර වැඩි කාල පරතරයක් තිබීමට විවිධ හේතූන් බලපානු ලබයි. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු යෙදිය යුතුවීම. |
| (ii) | 2018 වර්ෂය තුල ලද අයදුම්පත් සංඛ්‍යාව 11,483 ක් වූ අතර ඒ අතුරින් පරීක්ෂණ කටයුතු අවසන් කළ අයදුම්පත් සංඛ්‍යාව 5,042 ක් පමණක් විය. ඉන් ගැසට් නිවේදන පල කිරීම් සිදුකල සංඛ්‍යාව 485 ක් වන අතර අයදුම්පත් 02 ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. | පෙර වර්ෂ වල ලද අයදුම් පත් සඳහා ප්‍රමුඛතාවක් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද අයදුම් පරීක්ෂාව ප්‍රමාද වී තිබුණි. | වෙළඳ ලකුණු ලියාපදිංචිය කඩිනම් කරමින් ඉල්ලුම්කරුවන්ට සේවා සැපයීම කඩිනම් කල යුතුයි. |
| (iii) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොමැති ඉල්ලුම් පත් සංඛ්‍යාව 1752 ක් බව ඉදිරිපත් කර ඇති වාර්තා අනුව නිරීක්ෂණය වන අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම සංඛ්‍යාව 6446 දක්වා වර්ධනය වී තිබුණි. තවද 2019 අගෝස්තු 22 වන විට 9690 දක්වා වර්ධනය වී තිබු බවද නිරීක්ෂණය විය. | වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීම පියවර ගණනාවකින් සමන්විත වන සංකීර්ණ ක්‍රියාවලියකි. ප්‍රමාණවත් කාර්යමණ්ඩලක් නොමැති වීම හා අයදුම්පත් ගොනු කල දිනය සහ ලියාපදිංචි සහතික නිකුත්කල දිනය අතර වැඩි කාල පරතරයක් තිබීම මෙයට හේතුවයි. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය සඳහා කටයුතු කෙරෙමින් විවිධ අදියරයන්හි පැවති ගොනු සංඛ්‍යාව 68,687 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එය 65,169 ක් විය. | බුද්ධිමය දේපල පනතේ විධිවිධාන අනුව ලකුණ පිළිගැනීම හෝ නොපිළිගැනීම හා අයදුම් කරුවන් විසින් එම ලකුණ ලියාපදිංචි සහතික නිකුත් කිරීම දක්වා අඛණ්ඩව පවත්වාගෙන යාම හෝ නොයෑම සිදුවිය හැක. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |
| (v) | 2018 වර්ෂය තුල ලියාපදිංචි කටයුතු අවසන් කළ වෙළඳ ලකුණු සංඛ්‍යාව 5,192 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ලියාපදිංචි කළ වෙළඳ ලකුණු සංඛ්‍යාව 10,622 ක් විය. සමාලෝචිත වර්ෂයේ පෙර වර්ෂයට වඩා ලියාපදිංචි කළ වෙළඳ ලකුණු සංඛ්‍යාව 5430 ක් එනම් සියයට 51 ක් අඩුවී තිබුණි. | සීමිත නිලධාරීන් ප්‍රමානයක් අනෙකුත් වැඩ පියවරයන් සම්පූර්ණ කරමින් සහතික නිකුත් කල බැවින් ප්‍රමාද සිදුවිය. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |
| **(ආ)** | **නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම** ---------------------------------------- | | |
| (i) | සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 212 ක් වූ අතර ඒවා 2006 සිට 2017 දක්වා වර්ෂවල ලැබුණු අයදුම්පත් විය. ඒ අනුව මෙම පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම සඳහා වර්ෂ 1 සිට වර්ෂ 12 ක කාලයක් ගතවී තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. | පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |
| (ii) | පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කල දිනට පසු වර්ෂයේ සිට එම බලපත්‍රය වාර්ෂික ගාස්තුවක් ගෙවා අළුත් කල යුතුයි. නමුත් 2018 ජනවාරි 01 දින වන විට ලියාපදිංචි කර ඇති මුළු පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 4,619 ක් වූ නමුත් 2018 වර්ෂයේදී අළුත් කිරීම් සිදු කර තිබුණේ ගොනු 460 ක එනම් සියයට 10 ක් පමණි. | නිරීක්ෂණ පිළිගනිමි. | ලියාපදිංචිය හා අළුත් කිරීමේ කටයුතු පිළිබඳව බලපත්‍රලාභීන් දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියරයන්හි කටයුතු කෙරෙමින් පවතින ඉල්ලුම් පත් සංඛ්‍යාව 4,598 ක් වූ අතර ඒ තුල මූලික පරීක්ෂණ තත්ත්වයේ පවතින ගොනු 69 ක්ද, නවතාවය පිළිබඳ පරීක්ෂාව සිදු කිරීමට ඇති ගොනු 1,213 ක්ද, ගැසට් පත්‍රයේ පළවීමට නියමිත ගොනු 10 ක්ද සහතික පත්‍ර නිකුත් කිරීමට ඇති ගොනු 19 ක්ද විය. | නිරීක්ෂණ පිළිගනිමි. | බලපත්‍ර ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කල යුතුයි. |

**(ඇ) කාර්මික සැලසුම්**

-----------------

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුම් සංඛ්‍යාව 124 ක් වූ අතර ඒවා 2013 සිට 2018 වර්ෂ දක්වා කාලය තුල ලැබුණු අයදුම්පත් විය. ඒ අනුව මෙම අයදුම්පත් ලියාපදිංචිය සඳහා මාස 8 ක සිට වර්ෂ 5 ක් දක්වා කාලයක් ගතවී තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. | කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යක්ෂම කල යුතුයි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියරයන්හි පවතින කාර්මික සැලසුම් සංඛ්‍යාව 1,880 ක් විය. ඒ තුල මූලික පරීක්ෂණ තත්ත්වයේ පවතින ගොනු 89 ක් විය. | නිරීක්ෂණ පිළිගනිමි. | කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යක්ෂම කල යුතුයි. |
| (iii) | පනතේ 46(3) ප්‍රකාරව කාර්මික සැලසුම් ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳ ගැසට් පත්‍රයේ පළකල යුතු වුවත් වර්ෂය තුල අළුත් කරන ලද කාර්මික සැලසුම් 14 සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ 43(3) වගන්තිය අනුව නිවරදි විය යුතු අතර එයට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | පනතේ වගන්ති වලට අනුකූලව කටයුතු කල යුතුයි. |
| (iv) | 2018 වර්ෂය තුල ලද අයදුම්පත් සංඛ්‍යාව 288 ක් වූ අතර ඉන් 230 ක් මූලික පරීක්ෂණ සිදු කර අවසන් කර තිබූ නමුත් ගැසට් නිවේදන පළ කර තිබූ සංඛ්‍යාව 69 ක් විය. එයින් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණේ 16 ක් පමණි. | නිරීක්ෂණ පිළිගනිමි. | ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ කටයුතු කඩිනම් කල යුතුයි. |

**(ඇ) තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථාන ආරම්භ කිරීම (TISC)**

---------------------------------------

| | | | |
|---|---|---|---|
| (í) | සමාලෝචිත වර්ෂයේදී තෝරා ගන්නා ලද විද්‍යා මධ්‍යස්ථාන 09 ක තාක්ෂණික හා නවෝත්පාදන මධ්‍යස්ථාන ඇති කිරීමට සැලසුම් කර තිබුණද ඊට අයත් නොවූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පමණක් TISC ආරම්භ කර තිබුණි. | පැණ නැගුන ප්‍රායෝගික ගැටලු මත විද්‍යා මධ්‍යස්ථාන වල තාක්ෂණික හා නවෝත්පාදන මධ්‍යස්ථාන ඇති කිරීමට නොහැකි විය. | සැලසුම් වලට අනුකූලව කටයුතු කල යුතුයි. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථාන අතර බෙදාහැරීම සඳහා මුළු පිරිවැය රු.1,198,800 ක් වූ පරිගණක 12 ක් 2016 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබුණි. නමුත් 2019 අගෝස්තු 09 වන දින තෙක් මෙම පරිගණක අදාල මධ්‍යස්ථාන අතර බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | පරිගණක බෙදා දීම සඳහා කටයුතු කරමින් පවතී. | පරිගණක බෙදාදීමට කටයුතු නොකිරීම නිසා යල්පැනීම හේතුවන බැවින් සැලසුම් කල පරිදි අවශ්‍ය භාණ්ඩ පමණක් මිලදී ගැනීමට කටයුතු කල යුතු අතර මිලදී ගත් භාණ්ඩ බෙදාදීම අප්‍රමාදව කල යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | 2018 වර්ෂය ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ලකුණු 9,600 ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත්කිරීමට ආයතනය සැලසුම් කලද ලියාපදිංචි සහතික නිකුත්කර තිබුනේ 5,192 ක් එනම් සියයට 54 ක් පමණි. | සීමිත නිලධාරීන් ප්‍රමානයක් අනෙකුත් වැඩ පියවරයන් සම්පූර්ණ කරමින් සහතික නිකුත් කල බැවින් ප්‍රමාද සිදුවිය. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |
| ආ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී ප්‍රකාශන අයිතිය සම්බන්ධව කටයුතු කිරීම සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය භෞතික හා මානව යටිතල පහසුකම් සපයාදීම හා ප්‍රකාශන අයිතිය සම්බන්ධ දත්ත ගබඩාවක් සකස් කිරීම සඳහා IPAS පද්ධතිය වැඩි දියුණු කිරීමට සැලසුම් කර තිබුණද, එම කාර්යය ඉටු වී නොතිබුණි. | 2020 වර්ෂය වන විට සම්පූර්ණ කර ගැනීමට බලාපොරොත්තු වේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතුයි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | ----------------------------- | ---------- |
| සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදු කරනු ලැබූ අතර 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(I) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අරමුදලේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් 2019.04.06 දිනැති ලිපිය මගින් අනුමත කර ඇති අතර 2019 වර්ෂයේ ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් එම තනතුර සඳහා 2020 වර්ෂයේදී නිලධාරියෙක් අනුයුක්ත කර ගැනීමට පියවර ගන්නා ලෙසට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබාදී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |